# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## II වන වාර පරීක්ෂණය - 2014

**නර්තනය - I, II**

**8 ශ්‍රේණිය**

**කාලය පැය 1 1/2**

### නර්තනය - I පත්‍රය

නම / අංකය : ..............................................................................................................................

- අංක 01 සිට 20 තෙක් දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පාද සමග දෑත් හුරු කරනුයේ,

 i. වන්නම් නැටීමට ය. ii. පා සරඹ නැටීමට ය.
 iii. ගොඩ සරඹ නැටීමට ය. iv. කස්තිරම් නැටීමට ය.

02. කොහොඹා කංකාරිය අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායට ද?

 i. උඩරට ii. පහතරට iii. සබරගමු iv. නාඩගම්

03. ''ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා'' යන්න, කී වෙනි ගොඩ සරඹයේ කස්තිරම ද ?

 i. දෙවැනි i. තුන්වැනි iii. හතරවැනි iv. පස්වැනි

04. ලය ප්‍රධාන වශයෙන් කොටස්,

 i. 01 කි. ii. 03 කි. iii. 04 කි. iv. 05 කි.

05. හේවිසි වාදනය සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩ නම්,

 i. තම්මැට්ටම, දවුල ii. හොරණෑව, බටනලාව
 iii. ගැටබෙරය, උඩැක්කිය iv. උඩැක්කිය, යක්බෙරය

06. නර්තන නිර්මාණයක දී, දිසා හා තල නිසිලෙස යොදා ගැනීම නිසා,

 i. රංග රචනාව මගින් උසස් නිර්මාණයක් කළ හැකිය.
 ii. ලය උසස් ලෙස යොදා ගත හැකිය.
 iii. තිත නිසි ලෙස යොදා ගත හැකිය.
 iv. ඇඳුම් පැළඳුම් අලංකාර කරගත හැකිය.

07. රුවන්වැලිසෑයේ ධාතු නිදන් කිරීමේ උලෙළ සඳහා නලඟනන් පිරිවරා පැමිණියේ කවර රජතුමා ද ?

 i. වලගම්බා රජු ii. දෙවන පෑතිස් රජු iii. දුටුගැමුණු රජු iv. පරාක්‍රමබාහු රජු

08. පැල් රැකීමේ දී කාන්සිය නැති කර ගැනීමට ගායනා කළේ,

i. පතල් කවි ii. පැල් කවි iii. පාරු කවි iv. ලී කෙළි කවි

09. සරස්වතී මණ්ඩපය පිහිට වූයේ කුමන රජු කල ද?

i. පරාක්‍රමබාහු රජු ii. පණ්ඩුකාභය රජු
iii. භාතිකඅභය රජු iv. නරේන්ද්‍රසිංහ රජු

10. නර්තන නිර්මාණකරනයේ දී දිසා හා තල භාවිතයේ, ප්‍රධාන දිසා,

i. 10 කි. ii. 06 කි. iii. 08 කි. iv. 04 කි.

11. ''ඉසුරු දෙව්ඳු වඩින දිනා....'' මෙම කවි පදය අයත් වන්නම වන්නේ,

i. ගෙනයඩි ii. වෛරොඩි iii. හනුමා iv. තුරඟා

12. ''හේනේ පැලේ මා සිටිනා විහක්කන්...'' මෙය,

i. පතල් කවිය කි. ii. පාරු කවිය කි.
iii. පැල් කවිය කි. iv. ගොයම් කවිය කි.

13. ''මල් ගවසාලා කොණ්ඩය බැඳලා...'' මෙම කවි පදය,

i. ලී කෙළි කවිය කි. ii. සවරං කවිය කි.
iii. කුළු කවිය කි. iv. ගොයම් කවිය කි.

14. ''ගත්ත තෙහිඟු තකට තකුඳ...'' මෙම අඩව්ව අයත්වන වන්නම වන්නේ,

i. තුරඟා ii. හනුමා iii. සිංහරාජ iv. වෛරොඩි

15. උඩරට වන්නමක කොටස් වනුයේ,

i. බෙරපදය, තානම, කලාසම, අඩව්ව
ii. බෙරපදය, තානම, කවිය, කස්තිරම, සිරුමාරුව, අඩව්ව
iii. කවිය, ඉරට්ටිය, අඩව්ව, සිරුමාරුව
iv. කවිය, තානම, සිරුමාරුව, ඉරට්ටිය, කලාසම, අඩව්ව

**A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16. | කොහොඹා කංකාරිය | i. | මාත්‍රා 2 + 3 දෙතිතට අයත් රබන් පදයකි. |
| 17. | හේවිසි වාදනය හා සම්බන්ධ භාණ්ඩයකි. | ii. | වෙස් ඇඳුම් කට්ටලය |
| 18. | ඒ වත්ත මේ වත්ත තේ වත්ත ගාවා | iii. | මහ බඹා කෝළම |
| 19. | සමන් දේවාල පෙරහැර | iv. | පඬුවස් දෙව් රජු |
| 20. | අවුල් හැරය, තෝඩුපත්, පායිම්පත | v. | හොරණෑව |

(ලකුණු 1 × 20 = 20)

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

**(01.)** හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

i. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පා සරඹ 12 කි. ( )

ii. ''කුඳ ගත ගත දොං'' යන බෙරපදය මාත්‍රා 3 ට අයත් වේ. ( )

iii. පෙබරවාරි 04 ශ්‍රී ලංකාවේ නිදහස් උළෙළ පැවැත්වේ. ( )

iv. කුළු කවි ගැමි ගායනා වලට අයත් වේ. ( )

v. තුරඟා වන්නම මාත්‍රා 3 + 4 දෙකිතට ගයයි. ( )

vi. අස ඉගෙන ගන්නේ උඩරට නර්තන සම්ප්‍රදායයි. ( )

vii. අලියා සත්ත්ව චරිත වලට අයත් නොවේ. ( )

viii. දළදා පෙරහැර ඇසළ මාසයේ දැකිය හැකිය. ( )

ix. රබන් පද අත් රබානෙන් වාදනය කරයි. ( )

x. ලී කෙළි නැටුමට බුම්මැඩිය වාදනය කරයි. ( )

(ලකුණු 1 × 10 = 10)

**(02.)** ඔබ උගත් වෛරොඩි වන්නමට අදාළ ව,

i. බෙරපදය (ලකුණු 03)

ii. කවිය (ලකුණු 03)

iii. කස්තිරම ලියා දක්වන්න. (ලකුණු 04)

**(03.)** i. පොළොන්නරු යුගයේ නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 02 ක් ලියන්න. (ලකුණු 04)

ii. අනුරාධපුර යුගයේ නර්තන කලාව තිබූ බවට මහා වංශයේ ඇතුළත් තොරතුරක්, සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පොළොන්නරු යුගයේ නර්තන කලාව කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට සාධකයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

**(04.)** උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන් තුනෙන් ඔබ කැමති එක් සම්ප්‍රදායකට අයත් ශාන්තිකර්මයක් පිළිබඳව පහත සඳහන් සිරස්තල යටතේ පිළිතුරු ලියන්න.

i. ප්‍රචලිත ප්‍රදේශය 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

iii. නර්තන අංග 2 ක් නම් කරන්න. (ලකුණු 04)

iv. සැරසිලි සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය 2 ක් ලියන්න. (ලකුණු 02)